# නර්තනය - 8 ශ්‍රේණිය

## (පළමු වාරය )



The National e-learning Portal for the General Education

8 ශ්‍රේණිය නර්තනය

නිපුණතා මට්ටම - 2.5.1 නිවැරදි අංගහාර අනුගමනය කරමින් සාම්ප්‍රදායික නර්තන අංග ප්‍රදර්ශනය කරයි.

ක්‍රියාකාරකම - වන්නම් ගයමින් නටමු.

7 ශ්‍රේණියේ දී ඔබ නර්තනය කරන ලද තුරඟා වන්නම මතකයට නගා ගන්න.

එයට අත්වැලක් ලෙස

උඩරට - තුරඟා වන්නම

තිත : මාත්‍රා 2/3 දෙතිත (සුළු මැදුම්)
^ /
තාල රූපය : 1 2 1 2 3
බෙර පදය : දොං ජිංත ගත දොංත

තානම : තත් තත් තනත් තනෙන තත් තත් තනත් තනෙන
තත් තත් තනත් තම්ද නා නා
තන තනෙන තන තනෙන තතන නම් දන තනෙන
තානත් තනත් තම් ද නා නා

1 කවිය

සත් වෙත් මහත් අදර ලත් යුත් සිදත් කුමරු
ගත් සිත් තොසත් පැවිදි අංගා
අණ කරන ඡන්නයෙන කන්ථකය අසු ගෙනෙන
ගෙන යෙදුණ අසුගෙ පිට නැංගා

2 කවිය

ගත් ගත් පයත් අසුගෙ ශබ්දත් වසත් සුරිඳු
යන්නෙන් තොසින් තිදෙන සමඟ
යන යනෙන කල තිදෙන එතැන තැන පසුව දූන
ගංතෙරට පත් උණිය එමඟා

3 කවිය

ලත් ලත් සිතත් තිදෙන වෙත් වෙත් එකක් පසුව
මුත් කන්ථකත් වේ ය තුරු ඟා
සිඳුහතුන ගෙන වහන ඡන්න වලිගය අතින
පැන්නෙන් එතෙර අනොම ගංගා

4 කවිය

ගොත් සිත් මහත් රුසිරු ලත් යුත් සිඳත් කුමරු
ගෙන් සෙත් රැගත් තෙර්ත අංගා
තිදෙන පැන ගිය ගගින එතෙද අණ ගෙන බැතින
යෙදුව නැණ වර්ණයෙන තරු ඟා

කස්තිරම : කුඳ ගජිත කුඳ ගජිත කුඳ ගජිත කුඳ තා//
(දකුණ සහ වම)
කුඳ ගජිත කුඳ තා//
කුඳ තා//
කුඳ ගජිත කුඳ ගජිත කුඳ ගජිත කුඳ තා

සීරු මාරුව - තකු තකට ගත දොංත ගජ්ජිං ගජිං තකට

තකු තකට ගත දොංත දොංතා

අඩව්ව - තත් තකට තක රොං , තක්කඩ තක්කඩ කුඳ තක රොං

තක රොං ජිංගජිං ජිගත කිටි තකට කුංදත්

ජික රොං

2, 3 තාල රූපය අනුව සීරුමාරුව හා අඩව්ව පහත ආකාරයට තාල තබා කියන්න පුහුණු වන්න

තුරඟා වන්නමේ සීරුමාරුව සහ අඩව්ව

| | ^ | | / | | | ^ | | / | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1 | 2 | 1 | 2 | 3 | 1 | 2 | 1 | 2 | 3 |
| සීරු මාරුව | කු | ද | ග | ජි | ත | ග | ත | දොං | - | ත |
| | ගජ් | - | ජිත් | - | ග | ජිං | - | ජි | කු | ද |
| | කු | ද | ග | ජි | ත | ග | ත | දොං | - | ත |
| | දොං | - | තා | | | | | | | |
| අඩව්ව | තත් | - | ත | ක | ට | ත | ක | රොං | - | - |
| | තක් | කඩ | තක් | කඩ | කුඳ | ත | ක | රොං | - | - |
| | ත | ක | රොං | - | ග | ජිං | - | ජි | කු | ද |
| | කි | ටි | ත | ක | ට | කුං | - | දත් | - | - |
| | ජි | ක | රොං | - | - | | | | | |

තාලම්පටින් තිත වදින ස්ථානය පිළිබඳව විශේෂ අවධානය යොමු කරන්න.

<u>කාර්‍ය පත්‍රිකාව</u>

1. තුරගා වන්නමේ තාල රූපය නම් කරන්න
2. තුරගා වන්නම නිර්මාණයට පසුබිම් වී ඇති දේ පිළිබඳවව කෙටියෙන් ලියන්න
3. 2 + 3 තාල රූපය ට අදාල අඩව්වක් ලියන්න

හෝමාගම අධ්‍යාපන කලාපයේ " ගවේෂණ " අධ්‍යාපන නාලිකාව ඔස්සේ මෙම පාඩම ප්‍රායෝගිකව ඔබට අධ්‍යනය කළ හැක.

ඒ සඳහා " ගවේෂණ " නම් youtube channel වෙත පිවිසෙන්න.

8 ශ්‍රේණිය - තුරඟා වන්නම නර්තනය කරමු.